# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2291/06 – 2022 අගෝස්තු මස 01 වැනි සඳුදා – 2022.08.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: DSM/PL/LAND/අකු/ක්‍රීඩා පි./අත්.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍යවන පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩුගොඩ උඩසිය පත්තුව සුළු කොට්ඨාසයේ, අකුරම්බොඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අ. ග. පි. 32 හි අතිරේක අංක 24, පත්‍ර අංක 20 හි, කැබලි අංක 521 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්: 0.0203 (පර්චස් 08) වන "දිවුල්ගහමුල්ල පිල්ලැව" නමැති ඉඩම් කැබැල්ලට මායිම්:

**මායිම් උපලේඛනය**

උතුරට: කැබලි අංක 336 සහ 250; නැගෙනහිරට: කැබලි අංක 250; දකුණට: කැබලි අංක 250 සහ 251B; බටහිරට: කැබලි අංක 251B, 250 සහ 336.

මහජන කටයුත්ත කුමක්ද යන වග - මප/ග/ප/අකුරම්බොඩ කණිෂ්ඨ විද්‍යාලයේ ක්‍රීඩාපිටිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම

හිමිකම් කියන අය - සොයාගත නොහැක.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022.08.31 වැනි දින පෙරවරු 10.00 ට පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2022.08.24 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම්, සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

**එච්. එම්. සී. ඒකනායක,**
ප්‍රාදේශීය ලේකම්,
පල්ලේපොල.

2022 ජූලි මස 22 වැනි දින,
පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 08 – 0003

1A – G 37144 – 16 (2022/08)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*